සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

## සිංහල සාහිත්‍ය රසාස්වාදය

කාලය පැය 03 යි

නම/ විභාග අංකයː

- මෙම ප්‍රශ්න පත්‍රය I පත්‍රය හා II පත්‍රය යන කොටස් දෙකකින් සමන්විත ය.

### I - පත්‍රය

- I පත්‍රයේ ඇති ප්‍රශ්න දෙක සඳහා ප්‍රශ්න පත්‍රයේ ම උත්තර සපයා වෙන ම භාරදෙන්න.

(1) (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''එසේය සොඳුර පළමු මම උදකලායෙමි. දැන් අපි දෙදෙන මෝ වුම්හ''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

........................................................................................................

(ආ) මෙහි අපි දෙදෙන යනුවෙන් අදහස් කරන දෙදෙනා කවුද?

........................................................................................................

(ii) ''අක්කවත් වෙලාවක කියන්ඩකො ලොකු අයියට ඔය පරණ දේවල් ගැන හිත හිතා ඉන්නැතුව කසාදයක් බැඳ ගන්ඩ කියල''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක්ද?

........................................................................................................

(ආ) පාඨයේ ඇතුළත් වන පරිදි පරණ දේවල් යනු මොනවා ද?

........................................................................................................

(iii) <u>කුලුණු ගුණින්</u> යුතු උතුමන් සිත <u>මහරු</u>
දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු
නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු
තණ සුළකින් උණු කළ හැකි වෙති කවුරු

(අ) මෙහි මුල් පද දෙකෙහි අදහස ලියන්න.

........................................................................................................

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය වෙන් වෙන්ව ලියන්න.

........................................................................................................

(iv) මල්ලී කූඩුව පිළිස්සුනාට අඬන්න එපා. අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කූඩුවක් හදමු.

(අ) ප්‍රකාශය කළේ කවුද? ..............................

(ආ) මෙම කතාව ඇතුළත් කවර කෘතියේද? ..............................

(v) දොඩම් කපාලා ඇඹුල් තියාලා
නාන්න යන හැටි බලන් කලූ

(අ) මෙම කවිය ඇතුළත් වන්නේ කුමන කාව්‍ය ප්‍රභේදයට ද?

..............................

(ආ) මෙම කවි වල ඇතුළත් වන ලක්ෂණයන් ලියා දක්වන්න.

..............................

(ලකුණු 4 x 5 = 20)

02 පහත දැක්වෙන කොටස් දෙකින් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

තවද මහ රජ්ජුරුවන් වහන්ස, මාගේ සත්‍ය වචනයක් ඇසුව මැනව, මම මෙතැන් පටන් දිවි හිමියෙන් කයින් වචසින් මනසින් අමනාපයන් නොසිතමි, නොකරමි ඉදින් මා මෙසේ යාඥා වෙමින් සිටියදී මට ක්ෂමා නොකොට මාගේ බස් නොපිළිගත් සේක් වී නම් දැන් මපියාණන් වහන්සේ මෙසත් රජ දරුවන්ට මා සත් කඩක් කොට කපා දෙන සේක. එහෙයින් මට ක්ෂමා කොට රක්ක මැනවැයි යාඥා කළාය.

එකල කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීන් ගේ බස් අසා "ඉදින් සබඳ,තෙපි ම වේද දන්නා ඒ මට ඇයි දැයි කීම් නම් මුන්ගේ ළය පැලී යන්නේ ය. එහෙයින් මුන් අස්වසා කියමි යි සිතා ප්‍රභාවතීනී, තොප මේ ලෙස යාඥා වෙමින් සිටියදී කුමක් නිසා තොප කීවා නොකරමි ද තොප කෙරෙහි මාගේ මඳකුත් කෝපයත් කනස්සල්ලෙක් නැත්තේය. තවද තොපි කිසි විටකත් නො බව තවද කලණ ගුණයන් ඇති රාජපුත්‍රිය සත්‍ය වචනයක් ඇති කියමි. මමත් මෙතැන් පටන් කයින් වචනින් මනසින් අප්‍රියයක් නොකෙරෙමි. මේ එක මදු රජ කුලය තබා මෙබඳු නොයෙක් සිය ගණන් රාජ කුලයන් මර්දනය කොට මා කැමති පරිද්දෙන් තොප ඇරගෙන යන්ට සමර්ථ වූවත් මම තොප නිසා මාගේ එබඳු රාජ්‍ය ශ්‍රීය හැර හීන ක්‍රියා කෙරෙමින් මෙතෙක් දවස් මුළුල්ලෙහි දුක් වින්දෙමි. එබඳු වූ මා පෙනී සිටිය දී තොපට කිසියම් භයකුත් නැත්තේය යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජපිරිවරින් පිරිවරන ලදුව ක්ෂත්‍රියමාන උපදවාගෙන මා ජීවත්ව සිටිය දී මාගේ භාර්යාව අනිකෙකු ඇරගෙන යෙතැයි කේෂර සිංහ රාජයකු මෙන් පැලඹෙමි" මේ සියලු සාගල නුවර වාසීහු මා මෙතනට ආ බව දනිත්වයි ඇත මැත පනිමින් අභීත නාද පවත්වමින් අත්පොලසන් දෙමින් දැන් දැන් ඒ කොල්ලන් ජීව ග්‍රහයෙන් අල්වාගෙන එමි." සියලු අන්තඃපුර වාසීන් අස්වසා තව ද මණිකනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විරාජමාන වූ රථ යානාවක් හි හික්මුණා වූ කීකරු සියලු අශ්වාලංකාරයෙන් සරසන ලද අශ්වයන් යොදවා දැන් දැන් ශත්‍රු මථනය කරන්නා වූ මාගේ බල පරාක්‍රම සාමර්ථ්‍යය බලව. යනාදීන් අභීත නාද පවත්වමින් ශත්‍රු මථනය කිරීම මට භාරය. තෙපි තොපගේ මාළිගාවට ගොස් ඉස් සෝධා නහා සැරසී ගන වැද හිඳුවයි ප්‍රභාවතීන් එතනින් නික්මවූහ.

ඒ නියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන් ගෙයි මිදුලෙහි වට තිරයක් බැඳ එලවන ලද ඒ මගුල් කපුවා විසින් කරන ලද දැළි රැවුලු අන්දම් තිබීම් ඇතිව ඉස් සෝධා නහා සියලුරාජාභරණයෙන් සැරසී ඇමති මඬුලු ආදී දය මේ තැන් පිරිවරා මාළිගාවට යෙමින් අත්පොළසන් දෙමින් සියලු අන්තඃපුර සත්වයන් බල බලා සතුටු වන පරිද්දෙන් අභීතනාද පැවැත්වූහ.

(i) ඡේදයට අනුව මදු රජ්ජුරුවෝ කරන්නට තීරණය කර ඇත්තේ කුමක් ද?

.............................. (ලකුණු 04)

(ii) ප්‍රභාවතිය සමාව දෙන ලෙස කළ ඉල්ලීමෙන් අනතුරුව කුස රජතුමා ඇයව අස්වසා ලීමට සිතුවේ ඇයි.? ...................................................................................................................

.................................................................................................................. (ලකුණු 04)

(iii) ප්‍රභාවතිය අස්වසාලීමෙන් අනතුරුව කුස රජතුමා කළේ කුමක් ද?

..................................................................................................................

.................................................................................................................. (ලකුණු 06)

(iv) කුස රජුගේ නියෝගයෙන් පසුව අමාත්‍යයන් කළේ කුමක් දැ යි පැහැදිලි කරන්න.

..................................................................................................................

..................................................................................................................

.................................................................................................................. (ලකුණු 06)

(මුළු ලකුණු 20)

**නැතහොත්**

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නොවී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ටම එකතු වෙලා
ලොම් සිදුරක තරම්වත් අඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන් ගේ ජයම බලා

වඳින්නේ නැතිව ලොකු නිලධාරීන් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයත් සිතින් සිපා
අතත් පයත් ඔලුවත් වෙන වෙනම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවනත කර ගෙන වහම
අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරීන්ට විස්වාසය දෙන්ට එපා

(i) කවි පෙළෙහි සඳහන් වන යුතුකම් දෙකක් ලියා දක්වන්න.

.......................................................................................................................................

....................................................................................................................... (ලකුණු 04)

(ii) නිලධාරින් ගැන විස්වාසයක් තබන්නට එපා යයි කවියා පවසන්නේ කුමක් හේතුවෙන් ද?

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 04)

(iii) පැදි පෙළ තුළින් කවියා සමාජයට ලබා දෙන පණිවුඩය කුමක්ද?

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 06)

.(iv) පද්‍ය පන්තියේ සාර්ථකත්වය කෙරෙහි යොදා ගෙන ඇති භාෂාව කොතරම් දුරට ඉවහල් වී ඇති දැයි විමසන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(ලකුණු 06)

## II - පත්‍රය

සැලකිය යුතුයි :

- **පළමුවැනි ප්‍රශ්නය ද, 02, 03, 04, 05 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න. II පත්‍රයට අදාළ පිළිතුරු සපයා වෙනම භාර දෙන්න.**

(01) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන වචන 200 ක පමණ රසාස්වාදයන් ලියන්න.

දකුණේ මෙන්ම උතුරෙත් හිරු නගියි උදේ
රන්තරු රිදී තරු සවසට පෙළට ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර හඳේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ වැදේ

ගෙන එයි මිහිරිගී මඳ නල හමන විට
වැටහෙයි නොවැටහුණු සැඟවුණු කරුණු මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු නැත
හැම මොහොතකම ඇති උණුසුම් ගතිය මත
උගතිම් කිම ද මිනිහා සතු දෙනෙත නෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර වැටී
දකුණේ මෙන් ම උතුරෙන් හැම තැනම සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි හැටී
කළුගල් යකඩ නොව උණු වී හැළෙන ඉටී

බැඳ ඇති විලංගුව පා මිණි සලඹ කොට
සලකා වැටෙත එය බැන්දහු ඉදිරි පිට
මිනිසුන් දකුනෙ මෙන් උතුරෙන් පෙනෙන විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු දෙසින්

පැයකදි එකට හමුවන දුර ඇත දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙද කොතන
සුරුට්ටුවට එක් වී උතුරේ ඔතන
බේදය පිළිස්සී හමුවේවා දකුණ

(අ) මෙම පැදිපෙළට පාදක වූ අත්දැකීම

(ආ) අත්දැකීම ඉදිරිපත් කිරීමේ දී භාවිත කවෝපක්‍රම

(ඉ) පද්‍ය පන්තියේ භාෂා භාවිතය

(ඊ) පද්‍ය පන්තිය සඳහා යොදා ඇති ආකෘතිය

(උ) කවි පෙළෙහි කවියා මතු කරන කරුණු වල කාලීන වැදගත් කම (ලකුණු 6 x 5 = 30)

(02) ''පාඨක සිත් තුළ හාස්‍ය රසය ඇති කරන කතා වස්තුවකි, කුස ජාතකය.'' අවස්ථා තුනක්වත් යොදා ගනිමින් මෙම කරුණ පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(03) ''වෙසක් පහන කෙටි කතාව තුළින් ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියා කරන ආකාරය මැනවින් නිරූපණය කර තිබේ.'' උදාහරණ තුනක්වත් ගනිමින් විමසන්න. (ලකුණු 15 යි)

(04) ''ජන කවිය අපේ ගැමි ජීවිතය මැනවින් නිරූපණය කරන සාහිත්‍යාංගයකි.'' අදාළ අවස්ථා හා උදාහරණ තුනක්වත් ගෙන විමසීමත් කරන්න. (ලකුණු 15 යි)

(05) ''තුංමංහංදිය නව කතාවේ සාර්ථකත්වයට එහි මනා සිද්ධි ගැළපීම ඉවහල් වී ඇත.'' නිදසුන් තුනක් වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 (i) (අ) මහලු බමුණා (ශක්‍ර දේවේන්ද්‍රයා) (ආ) මහලු බමුණා හා සීලවතී බිසව

(ii) (අ) පුංචි අම්මා

(ආ) මාමා කන්තිමහර පොඩි මහත්තයාගේ දුව (සුදු මැණිකේ) ගැන තිබූ ප්‍රේම සබඳතාව ගැන තාමත් සිතේ තබා ගෙන ඉඳීම.

(iii) (අ) කරුණා ගුණයෙන් යුක්ත උතුමෙකුගේ වටිනා සිත දුර්ජනයන්ගේ වචන වලින් නපුරු කළ නොහැකිය.

(ආ) කරුණා ගුණයෙන් , මහරු - ඉතා වටිනා

(iv) (අ) වෙසක් පහන කෙටි කතාවේ කථකයා (අයියා)

(ආ) ජී. බී. සේනානායකගේ දුප්පතුන් නැති ලෝකය

(v) (අ) ජන කවි (ඔලිඳ කෙලිය)

(ආ) අව්‍යාජ බව, ජීවන වෘත්තිය හා බැඳුණු අත්දැකීම් ජන කවි තුළ නිරූපණය වීම.

(ලකුණු 04×05=20)

02. (i) ප්‍රභාවතීය, සත් රජවරුන්ට සත් කඩක් කොට කපා දීමට ය. (ලකුණු 04)

(ii) ප්‍රභාවතියගේ ළය පැලී යන්නේය. යන බියෙන් ය. (ලකුණු 04)

(iii) අභීතනාද පැවැත්වීම. අත්පොලසන් දීම. (ලකුණු 06)

(iv) මුළුතැන් ගෙයි මිදුලේ වටතිර බැඳීම - දැළි රැවුලු අන්දම් තිබීම.
ඉස්සෝධා නහා සියලු රාජාභරණයෙන් සැරසීම ආදී දේවල් ය. (ලකුණු 06)

<u>නැතහොත්</u>

(i) රට, ජාතිය පිළිබඳ සැලකීම / අසල් වැසියාට උදවු කිරීම. (ලකුණු 04)

(ii) කුලමල ආදිය ගැන සළකමින් මිනිසුන් භේද බින්න කරන නිසා
ගම්මුන් පරිහානියට පත් කරන නිසා (ලකුණු 04)

(iii) විවිධ භේද අතහැර තම යුතුකම් හා වගකීම් රට ජාතියට අසල්වැසියාට
ඉටු කළ යුතු බව. (ලකුණු 06)

(iv) සරල මෙන්ම භාව පූර්ණ වදන් පෙළකි.
කිව යුතු කරුණු සහෘදයාට වටහා ගැනීම පහසුය. (ලකුණු 06)

## II කොටස

මෙම පත්‍රයේ ප්‍රශ්නවලට සිසුන් සපයා ඇති පිළිතුරුවල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව පිළිබඳ සැලකිලිමත් වෙමින් සුදුසු ලකුණක් ප්‍රදානය කරන්න.

01. (අ) උතුරේ හා දකුණේ ජනයා අතර පවතින මත ගැටුම් නිසා රට පරිහානියට පත්ව ඇති ආකාරය.
මේවා ඉවත් කර සමෙය, සහජීවනය ගොඩ නැගිය යුතු බව.

(ආ) රූපක, සංකේත, ව්‍යාංගර්ථය, එළිසමය වැනි,

(ඉ) සරල භාෂාව, ධ්වනිතාර්ථවත් ය.

(ඊ) සිවුපද ආකෘතිය / එළිවැට යොදාගෙන තිබේ.

(උ) ජාතිභේද මිනිසා විසින්ම ඇති කර ගත් වැදගත් නොවන ගැටලු ය. මානව දයාවෙන් ශ්‍රී ලාංකිකයන් ලෙස අපේ සමෘද්ධිය ගොඩ නගා හැකි බව පෙන්වා දෙයි. (ලකුණු 06×05=30)

- අංක 02, 03, 04, 05 යන ප්‍රශ්නවලට අදාළ කරුණුවල ගැළපීම, ඒවාට දී ඇති නිදසුන්වල යෝග්‍යතාව පිළිබඳව සලකා අදාළ ලකුණ පිරිනමන්න.